සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 06 - 2023

## නාට්‍ය හා රංග කලාව

කාලය පැය යි

නම / විභාග අංකයඃ

පහත සඳහන් A,B,C,D,E කොටස් ඇසුරෙන් එකේ සිට පහ දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. "මව්පිය දෙදෙනාට සලකාපන්නේ
හිරිහැර කෙරුමට සිත නොම ගන්නේ
බසිමින් පාරට පැන නුදුවන්නේ
දවසින් දවසම දැන හැදියන්නේ"

B. කියාපන් යාළුවේ, කියාපන් මොකද මේ හනිකේ පස්ස නොබලාම දුවන් යන්නේ?

C. කැත්තක් අරගෙන වත්තට යනකොට පෙත්තෙක් ඉඳගෙන කජු කනවා.

D. කිසිම දෙයක් ලැබුණේ නැහැ
කුස්සි ගානේ ඇවිද්දා මං
දැන් ඉස්සර වගේ ගේවල
වැඩිපුර කෑමත් නෑනේ

E. "දුකක් නැති ව මා ඇති කළ අම්මාට
මිටක් වත් දුන්නේ නැත වී ඉල්ලු විට
දෙකක් වී මැනලා දීලත් මල්ලකට
මොකක් කියනවද මැහැලියේ පල දොරට

01. සිරිත් මල්දම කවි පන්තියට අයත් කවියක් වන්නේ
1. E 2. C 3. A 4. D

02. බුදුන් වඳින ලෙස වැඳපන් අම්මාට යන ජන කතාවට අයත් වන්නේ
1. A 2. E 3. C 4. B

03. D අක්ෂරය ට අදාළ සංවාදය ඇතුලත් නාට්‍යය වන්නේ.
1. අමර ගියා දිව්‍යලෝකෙ
2. නරිබෑනා
3. මාෂා සහ වළහා
4. පුංචි අපට දැන් තේරෙයි

04. කටහඬ වර්ධනය සඳහා යොදාගත හැක්කේ
1. A 2. C 3. D 4. B

05. B අක්ෂරය ඇතුලත් ජනකතාව වන්නේ
1. නාඩි බැලීම
2. අහස කඩා වැටීම
3. හීල්බත් දංකුඩ
4. අනුන්ට කැපූ වලේ තමන් වැටීම.

**ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා නිවැරදි පිළිතුර තෝරන්න.**

6. නාට්‍යයක දැකිය හැකි ලක්ෂණයක් නොවන්නේ
   1. පිටපතක් පැවතීම.
   2. අසා බලා රස විඳීම.
   3. ශ්‍රාවකයා අරමුණු කරගැනීම.
   4. චරිත තිබීම.

7. නව නිර්මාණ බිහි කිරීම අත්‍යාවශ්‍ය වන්නේ,
   1. අභිරූපණය.
   2. සමාරෝපය.
   3. සතර අභිනය.
   4. පරිකල්පනය.

8. කටහඬ පාලනය සඳහා සිදු කළ යුතු වන්නේ,
   1. ස්වසන අභ්‍යාස.
   2. සංවේදන අභ්‍යාස.
   3. ශිථිලකරණ අභ්‍යාස.
   4. කටහඬ අභ්‍යාස.

9. මිනිසුන් අනුකරණය කිරීමේදී සැළකිලිමත් නොවිය යුතු කාරණයකි
   1. චරිතයේ ස්වාභාවය.
   2. චරිතයේ මනා රූ සපුව.
   3. කටහඬ.
   4. භාවිත කරන භාණ්ඩ.

10. ජනකතාවකට අයත් නොවන්නේ,
    1. හීල්බත් දංකුඩ.
    2. නාඩි බැලීම.
    3. සිරිත් මල්දම.
    4. තොප්පි වෙළෙන්දා.

**ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**
**(ක්ෂණික නිරූපණ, මුල මැද අග, යෝධයන්, රබන් පද, නාට්‍යෝපකරණ)**

11. නළුවා රඟපෑම සඳහා යොදාගන්නා භාණ්ඩ ........................... නම් වේ.
12. පෙර සූදානමකින් තොරව ඉදිරිපත් කරන්නේ ........................... යි.
13. කටහඬ වර්ධනය සඳහා යොදාගත හැකි වන්නේ ........................... යි.
14. කතාන්දරයක මනාව ........................... ගලපා තිබිය යුතුය.
15. ........................... අධිමානුෂ චරිත යටතට ගැනේ.

**ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වල දී ඇති ප්‍රකාශ හරිනම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

16. චරිතයක් ඒ අයුරින්ම කර පෙන්වීම අනුකරණයයි. (      )
17. ජනකතාව අසා බලා රස විඳිය හැකිය. (      )
18. "සිරිත් මල්දම" කවි ඇසුරෙන් නාට්‍ය නිර්මාණය කළ නොහැක. (      )
19. නාට්‍යයක ප්‍රබල සංවාද හා රංග විධාන ඇතුලත් පිටපතක් දක්නට ලැබේ. (      )
20. සත්ත්ව චරිත අනුකරණයට නිරීක්ෂණය අත්‍යාවශ්‍ය නොවේ. (      )

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ**
- **තවත් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.**

"මොකදෑ, මොකදෑ මේ මහා විපත්තියක් වෙලා වගේ" (මුවෝ විමසති). එවිට සෙසු පිරිස මෙසේ පිළිතුරු දෙති)." "ආං අහස පාත්වෙලා පොළොවට" මෙහිදී මුව පිරිස කලබල වෙමින් "අපි කම්මුතුයි, අපි කම්මුතුයි. දුවමු දුවමු එහා කැලේට" (යැයි කියමින් දුවන්නට පටන් ගනිති).

01. 1. මෙම සංවාද ඛණ්ඩය අයත් වන කතාන්දරයේ නම කුමක්ද?
    2. මෙම කතාන්දරයෙන් ලබාදෙන පණිවිඩය කුමක්ද?
    3. මෙහිදී අනුකරණය කළ හැකි සත්ත්ව චරිත මොනවාද?
    4. ඔබ සඳහන් කළ සත්ත්ව චරිත දෙකකට ආවේණික හැසිරීම් රටා දෙක බැගින් ලියන්න
    5. ඉහත සංවාද ඛණ්ඩයේ ඇති රංග විධානයක් ලියා දක්වන්න.

02. 1. නාට්‍යයක් යනු කුමක්ද?
    2. ඔබ දන්නා වේදිකා නාට්‍යය තුනක් නම් කරන්න.
    3. කතන්දරයක හා වේදිකා නාට්‍යයක දක්නට ලැබෙන සාමානතා හා අසමානතා තුන බැගින් ලියන්න

03. 1. අධිමානුෂ චරිතයක් යනු කුමක්ද?
    2. ඔබ දන්නා මනුෂ හා අධි මානුෂ චරිත තුන බැගින් ලියන්න.
    3. මනුෂ හා අධිමානුෂ චරිත වල දක්නට ලැබෙන වෙනස්කම් තුන බැගින් ලියන්න.

04. 1. සිරිත් මල්දම පද්‍ය පන්තියේ රචකයා ගේ නම කුමක්ද?
    2. එම කවි පන්තියේ ඇතුලත් කවි දෙකක් ලියන්න.
    3. ඔබ සඳහන් කළ කවි දෙකේ ඇතුළත් යහපත් ගුණ ධර්ම මොනවාද?

05. පහත සඳහන් පරිසර අත්දැකීම් වලින් එකක් තෝරා ගෙන ඒ තුළින් කතන්දරයක් ගොඩනගන්න.
    1. කුඹුරක් මැද සිදිමින් පවතින දිය වලක් - මාළු දෙදෙනෙක්- දිය වල දෙස බලා සිටින කොකෙක්.
    2. පූසෙක් - කේක් කෑල්ලක් - බල්ලෙක් - කේක් කෑල්ලට මාන බලන කපුටෙක් - රැවටීමක්
    3. මඩ වළක නෙළුමක් - මී මැස්සෙක් - නිල මැස්සෙක් - සමනළයෙක් - මල් නෙළන ළමයෙක්

සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 06 - 2023

## නාට්‍ය හා රංග කලාව - පිළිතුරු පත්‍රය

I කොටස

1 - (3) 2 - (2) 3 - (4) 4 - (2) 5 - (2) 6 - (3) 7 - (4) 8 - (1) 9 - (2) 10 - (3)

11. නාට්‍යෝපකරණ 12. ක්ෂණික නිරූපණ 13.රබන් පද 14. මුල, මැද, අග 15. යෝධයන්

16. √ 17. x 18. x 19. √ 20. x

(බහුවරණ ප්‍රශ්න සඳහා එක් ප්‍රශ්නයකට එක බැගින් ප්‍රශ්න 20x1 = 20)

II කොටස

01) 1. අහස කඩා වැටීම (ල 02)
2. හේතු නොදැන කලබල වීම නිෂ්ඵල ක්‍රියාවකි. (ල 02)
3. හාවුන්, මුවන් (ල 02)
4. හාවුන්- පැන පැන යාම, වේගයෙන් දිවීම මුවන් - කකුල් 4 ඇවිද යාම,
නිතරම ඉතා අවධානයෙන් වටපිට බැලීම. (ල 02)
5. (දුවන්නට පටන් ගනී) (ල 02)

02) 1. "යමක් කර පෙන්වීම" යන මූලික අදහස සහිතව ලියා ඇති පිළිතුරු සඳහා ප්‍රමාණවත් ලකුණු ලබා දෙන්න (ල 02)
2. අමර ගියා දිව්‍ය ලෝකේ
මාෂා සහ වළහා
කදා වළලු (නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න) (ල 03)
3. සමානතා
අවස්ථාවක් සිද්ධියක් මූලික කරගැනීම
චරිත
සංවාද
අසමානතා

| | | |
|---|---|---|
| නාට්‍ය: අසා බලා රසවිඳීම | කතාන්දරය: අසා රසවිඳියි | |
| නලුවන් විසින් රඟදැක්වීම | කථකයා විසින් කියාපායි | |
| පිටපතක් සහිතයි | පිටපතක් රහිතයි | (ල 05) |

(ගැළපෙන පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න)

03) 1. සාමාන්‍ය මිනිස් ස්වභාවය ඉක්මවා යන මිනිස් චරිත අධිමානුෂ චරිත වේ. (ල 02)
2. මානුෂ: අම්මා, ගුරුතුමිය, ක්‍රීඩකයා
අධිමානුෂ : සුරංගනාව, යෝධයන්, රාක්ෂයන් (ල 03)
3. (ගැළපෙන පිළිතුරු සඳහා අදාළ ලකුණු ලබා දෙන්න) (ල 05)

04) 1. ඇම්. ඇල්. සිල්වා ගුරු මුහන්දිරම් (ලකුණු 02)
2. ගුරු මාර්ගෝපදේශයේ ඇති කවි 6 ඕනෑම කවි දෙකක් හෝ සිරිත් මල්දම පොතේ ඕනෑම කවියකට ලකුණු ලබා දෙන්න. (ල 03)
3. එම කවිවලට අදාළව ගුණධර්ම ලියා ඇත්නම් අදාළ ලකුණු ලබා දෙන්න. (ල 05)

05. තෝරාගත් අත්දැකීමට අදාළ වන පරිදි නාට්‍යෝචිත අවස්ථා ගොඩ නගමින් මුල, මැද, අග මනාව සංකලනය කර ඇති කතාන්දර සඳහා අදාළ ලකුණු ලබා දෙන්න. (ල 10)